පාර්ලිමේන්තුවේ පුස්තකාලය
1979 - 1 - 17

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1978 අංක 11 දරන ඉන්ධන පිරිමැසීමේ දින පහේ සතිය පනත

---

[සහතිකය සටහන් කළේ 1978 දෙසැම්බර් මස 5 වන දින]

ආණ්ඩුවේ නියමයයි පරිදි මුද්‍රණය කරන ලදී.

1978 දෙසැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල : ශත 30 යි නැපැල් ගාස්තුව : ශත 25 යි

# 1978 අංක 11 දරන ඉන්ධන පිරිමැසීමේ දින පහේ සතිය පනත

[සහතිකය සටහන් කළේ 1978 දෙසැම්බර් මස 5 වන දින]

එල්. ඩී.—ඕ. 47/77

**සෙනසුරාදා දිනයන් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල සහ වෙනත් ඇතැම් ආයතනවල වැඩ කරන දිනයන් ලෙස සලකනු නොලැබීම සඳහා ද එම දෙපාර්තමේන්තුවල සහ ආයතනවල වැඩ කරන පැය ගණන විධිමත් කිරීම සඳහා ද ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සඳහා ද විධිවිධාන සැලසීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඩු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.**

1. මේ පනත 1978 අංක 11 දරන ඉන්ධන පිරිමැසීමේ දින පහේ සතිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය (මෙහි මින් මතු "අදාල දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1977 පෙබරවාරි මස 17 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

**සෙනසුරාදා දිනයන් වැඩකරන දිනයන් නොවිය යුතු බව.**

2. මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ අදාල දිනයට පෙරාතුව ම සෙනසුරාදා දිනයන් වැඩ කරන දිනයන් නොවූ හෝ වැඩ කරන දිනයන් විය යුතු යයි නියම නොවූ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක හෝ කර්මාන්තයක නැතහොත් ජාතික ආර්ථිකය හේතුකොටගෙන හෝ යම් කර්මාන්තයක් හෝ කාර්මික ව්‍යාපාරයක් මනා ලෙස විධිමත් කිරීම සඳහා මේ පනත යටතේ නියෝග සෑදීම අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි අමාත්‍යවරයා සලකන අවස්ථාවක, එසේ සාදනු ලබන නියෝග මගින් නිශ්චය කරනු ලබන වෙනත් යම් ආයතනයක හෝ ඉන් කොටසක සෙනසුරාදා දිනයන් වැඩ කරන දිනයන් නොවිය යුතු ය:

එසේ වුව ද, ජාතික ආර්ථිකය හේතුකොටගෙන හෝ යම් කර්මාන්තයක් හෝ කාර්මික ව්‍යාපාරයක් මනා ලෙස විධිමත් කිරීම සඳහා මේ පනත යටතේ නියෝග සෑදීම අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි අමාත්‍යවරයා සලකන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් එසේ සාදනු ලබන නියෝග මගින් ඉහත දැක්වෙන විධිවිධාන අදාල කිරීමෙන් නිදහස් කරනු ලැබිය හැකි යම් ආයතනයකට හෝ ඉන් කොටසකට ඒ විධිවිධාන අදාල නොවිය යුතු ය.

**සඳුදා සිට සිකුරාදා දක්වා වැඩ කළ යුතු පැය ගණන.**

3. මේ පනත යටතේ සෙනසුරාදා දිනයන් වැඩ කරන දිනයන් නොවන ආයතනයක සෑම සේවකයකු ම, අදාල දිනයට පෙරාතුව ම ඔහු වැඩ ආරම්භ කළ සහ නිම කළ වේලාවට වැඩ ආරම්භ කිරීම සහ නිම කිරීම, සඳුදා සිට සිකුරාදා දක්වා වූ සෑම දිනයක ම කළ යුතු අතර, සෙනසුරාදා දිනවල ඔහු වැඩ කර ඇත්තාක් මෙන් ඔහුට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

ඊ 87276—14,025 (78/10)

සෙනසුරාදා වැඩකරන දිනයක් නොවීමේ හේතුවෙන් සඳුදා සිට සිකුරාදා දක්වා කරනු ලබන අමතර වැඩ සඳහා අතිකාල ගෙවීම් නොමැති බව.

4. යම් නීතියක, ව්‍යවහාරයක, චාරිත්‍රයක හෝ ගිවිසුමක පටහැනිව කුමක් සඳහන් වුව ද, සෙනසුරාදා වැඩ කරන දිනයක් නොවීමේ හේතුවෙන් යම් සේවකයකු සඳුදා සිට සිකුරාදා දක්වා වැඩ කරන අමතර පැය ගණන වෙනුවෙන් අතිකාල ගෙවීමක ස්වභාවයේ යම් මුදල් ප්‍රමාණයක් ගෙවනු ලැබීමට එවැනි සේවකයකුට හිමිකමක් නොතිබිය යුතු ය.

සෙනසුරාදා වැඩ කිරීම සඳහා අතිකාල ගෙවීම.

5. මේ පනත යටතේ සෙනසුරාදා වැඩ කරන දිනයක් නොවන යම් ආයතනයක සේවකයකුට සෙනසුරාදා දිනයක වැඩ කරන ලෙස ඔහුගේ සේවායෝජක විසින් නියම කරනු ලබන්නා වූ ද ඒ අනුව ඔහු එසේ වැඩ කරන්නා වූ ද අවස්ථාවක, එම වැඩ කිරීම සම්බන්ධයෙන් අතිකාල ගෙවීමක ස්වභාවයේ මුදලක් ලැබීමට ඔහුට හිමිකම් ඇති අතර ඔහුට එය ගෙවනු ලැබිය යුතු ය.

වැටුප් ගෙවීම සනාදිය අඩු වාසිදායක නොවිය යුතු බව.

6. අදාල දිනයට පෙරාතුව ම යම් සේවා යෝජකයකු විසින් 2 වන වගන්තියෙහි විධිවිධාන අදාළ වන ආයතනයක සේවයෙහි නියුක්ත කර ගනු ලැබ සිටි සෑම සේවකයකු ම, ඒ දිනයට පෙරාතුව ම ඒ සේවකයා භුක්ති විඳිමින් සිටි වැටුප්, දීමනා සහ (කවර වූ හෝ නමකින් හඳුන්වනු ලබන) වෙනත් මුදල් ගෙවීම් පිළිබඳ වූ නියම හා කොන්දේසිවලට අඩුවෙන් වාසිදායක නොවන නියම හා කොන්දේසි පිට, වෙනත් ලිඛිත නීතිවල විධිවිධානවලට යටත් ව, තවදුරටත් ඒ සේවයෙහි එසේ නියුක්ත කරනු ලැබ සිටිය යුතු ය.

වාර්ෂික නිවාඩුවල කාර්යය සඳහා සෑම සේවා යෝජකයකු ම විසින් සෙනසුරාදා ගණන් ගත යුතු බව.

7. 2 වන වගන්තියේ විධිවිධාන අදාළ වන කවර ආයතනයක වුව ද සෑම සේවායෝජකයකු ම විසින්, තමා යටතේ සේවයේ නියුක්ත සෑම සේවකයකුට ම පඩි පාලක සභා ආඥාපනත යටතේ පිහිටුවන ලද යම් පඩි පාලක සභාවක යම් තීරණයක විධිවිධාන අනුව වාර්ෂික නිවාඩු දීම පිණිස ඒ සේවකයා වැඩ කළ දින ගණන ගණන් බැලීමේ කාර්යය සඳහා, එක් එක් සතියේ සෑම සෙනසුරාදා දිනයක් ම එම සේවකයා වැඩ කළ දිනයක් ලෙස ගණන් ගත යුතු ය.

මේ පනතේ විධිවිධානවල බලපෑම.

8. 6 වන වගන්තියේ විධිවිධාන හැර මේ පනතේ විධිවිධාන, වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද, බලපැවැත්විය යුතු ය.

නියෝග.

9. (1) මේ පනත යටතේ නියෝග සෑදිය යුතු යයි නියමිත කාර්යයන් සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ කිසිම නියෝගයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ පාර්ලිමේන්තුව විසින් එය අනුමත කරනු ලබන තුරු බලනොපැවැත්විය යුතු ය.

**වැරදි සහ දණ්ඩන.**

**10.** (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කරන හෝ ඒවා අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ හය මසකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) යම් සේවායෝජකයකුගේ සේවකයකුට මේ පනත යටතේ ගෙවීමට නියමිත මුදල් ප්‍රමාණය ගෙවීම පැහැර හරින සේවායෝජකයකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ හය මසකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ වරදකට සේවායෝජකයකු වරදකරු කරනු ලැබූ විට වෙනත් යම් දණ්ඩන නියමයකට අතිරේකව අධිකරණය විසින් ආඥාවක් කිරීමෙන්, මේ පනතේ විධිවිධාන යටතේ ඒ සේවකයාට ලැබිය යුතුව ඇතැයි අධිකරණය තීරණය කරන මුදල් ප්‍රමාණය එම ආඥාවෙහි නිශ්චිත කාලසීමාව ඇතුළත ඒ සේවකයාට ගෙවන ලෙස සේවායෝජක වෙත අණ කළ හැකි ය. එම මුදල එසේ ගෙවනු නොලැබුවහොත් එම මුදල දඩයක් අයකර ගන්නා ආකාරයෙන් ම අයකර ගෙන එම සේවකයා වෙත ගෙවනු ලැබිය හැකි ය.

**පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.**

**11.** සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වූ වරදක් කරනු ලබන අවස්ථාවක, ස්වකීය දැනුම නොමැතිව ඒ වරද සිදු කරන ලදැයි හෝ ස්වකීය කටයුතුවල ස්වභාවය සහ සියලු කරුණු ගැන සැලකිලිමත්ව ඒ වරද සිදු කරනු ලැබීම වැළැක්වීම පිණිස නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කරන ලදැයි හෝ ඔප්පු කළහොත් මිස, වරද කරනු ලැබූ අවස්ථාවෙහි ඒ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකුව, සාමාන්‍යාධිකාරීවරයකුව, ලේකම්වරයකුව හෝ වෙනත් සමාන නිලධරයකුව සිටි සෑම තැනැත්තකු ම ඒ වරදට වරදකරු ලෙස සලකනු ලබන්නේ ය.

**අර්ථ නිරූපණය.**

**12.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"පළාත් පාලන ආයතනය" යන්නෙන් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ ;

"සේවායෝජක", "කර්මාන්තය" සහ "සේවක" යන්නට පඩි පාලක සභා ආඥාපනතෙහි පිළිවෙලින් දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.